# මේ වසරේ දෙවන කාර්තුවේ ආර්ථිකය සියයට 16.3කින් පහළට

## ඉතිහාසයේ මෙතෙක් විශාලම පහත වැටීම

ශ්‍යාම් නුවන් ගනේවත්ත

ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ විශාලතම පහත වැටීම සනිටුහන් කරමින් මේ වසරේ (2020) දෙවන කාර්තුවේ ආර්ථිකය සියයට 16.3 කින් පහත වැටී ඇත.

2020 දෙවන කාර්තුවේ ස්ථාවර මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කර ඇති අතර, එය 2019 දෙවන කාර්තුවේ වාර්තා වූ සියයට 1.1 ධන වර්ධනය හා සසඳන විට මෙතෙක් වාර්තා නොවූ ලෙස සියයට 16.3 කින් පහත වැටී ඇතැයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි.

2020 දෙවන කාර්තුවේ දී ඉතා සුළු රටවල් සංඛ්‍යාවක හැර මුළු ලෝකයේම ආර්ථිකයේ විශාල පසුබැසීම් වාර්තා වී ඇති බවද එම දෙපාර්තමේන්තුව පවසයි.

මෙම කාර්තුව පිළිබඳව සලකා බලන විට, මාර්තු 19 සිට අප්‍රේල් 20 දක්වා කාලය තුළ මුළු රටම සම්පූර්ණයෙන් වසා දමා තිබුණි. ඉන් පසුව දිස්ත්‍රික්ක වෙත පැනවූ ඇඳිරි නීතිය ක්‍රමයෙන් ඉවත් කරන ලදී. කෙසේ වෙතත් මැයි 26 වන දින දක්වා ප්‍රධාන කාර්මික කලාප සහ ව්‍යාපාරික ස්ථාන වැඩි ප්‍රමාණයක් පිහිටා ඇති ප්‍රධාන දිස්ත්‍රික්ක දෙක සඳහා (කොළඹ සහ ගම්පහ) පැනවූ ඇඳිරි නීතිය තවදුරටත් ක්‍රියාත්මක විය. කොවිඩ්-19 රෝගය ප්‍රජාව අතර පැතිරීම පාලනය කිරීම සඳහා රජය මඟින් මෙම ඇඳිරි නීතිය පැනවූ අතර එමඟින් රජය සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නා ලදී.

මේ අතර 2020 වර්ෂයේ තුන්වන කාර්තුව තුළ දී කොවිඩ්-19 වසංගතයේ පළමු රැල්ලෙන් පසුව ව්‍යාපාරික ක්‍රියාකාරකම් නව සාමාන්‍යකරණය වීමත් සමඟම ජනතාවගේ එදිනෙදා ජීවන රටාව යථා තත්ත්වයට පත්විය. මෙම වාසිදායක තත්ත්වය විශේෂයෙන් තුන්වන කාර්තුවේ දී ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපා ඇති අතර මෙම තත්ත්වය 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රථම වතාවට සියයට 1.5 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කිරීමට හේතු වී තිබේ.